# පුළුකුණාව (වෙහෙරගල්කන්ද) විහාරයේ ඓතිහාසිකත්වය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

වෙලම්පැලේ රතනසාර හිමි[1]

ඓතිහාසික වෙහෙරගල්කන්ද විහාරය, මඩකලපුව දිස්ත්‍රික්කයේ එරවිල් පොරතිව් හා මන්මුනෙයි පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පැරණි විහාර අංගයන්ගෙන් සමන්විත පුරාවිද්‍යාත්මක ස්ථානයකි. මෙම විහාරය වත්මනෙහි පුළුකුණාව නම් ග්‍රාමීය නාමයෙන් හඳුන්වයි. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවලට අනුව ඵුස්සදේව හා ථේරපුත්තාභය නම් ඇති තෙරවරු මෙහි වැඩසිටි බව තහවුරු වී තිබේ. ලක්දිව විශාලතම ශෛලමය ආසන සරය අයත් වන්නේ පුළුකුණාවටයි. පැරණි විහාර ගෘහ, ධර්මශාලා, ස්ථූප, ස්වාභාවික පොකුණු, පියගැටපෙලවල් සහ කටාර සහිත ලෙන් ආදී පැරණි විහාර අංගයන්ගේ නටඹුන් මෙහි දැකගත හැකිය. ඉහත දැක් වූ නටඹුන් පුළුකුණාව පර්වත තැනි තලාවේ හා පාමුල පවතී. පර්වතය පාමුල පවතින ප්‍රධාන ස්ථූපය හඳුන්වන්නේ මියගුණ සෑය නමිනි. ලෙන් ලිපි බ්‍රාහ්මී අක්ෂරයෙන් රචිත ඒවාය. ඇතැම් ලෙන්වල ආදි ජනාවාස ලක්ෂණ දැකගත හැකි ය. පර්වත තැනිතලාවේ පොකුණක් පවතී. අසළ පවතින වැව විහාර සංකීර්ණයේ කොටසක් වශයෙන් සැලකිය හැකිය. එය වටා පවතින පාෂාණ එහි පෞරාණික බව සහතික කරයි. පුළුකුණාව විහාර භූමියේ පුරාවිද්‍යාත්මක විශේෂතා මොනවා ද? යන්න මෙහි පර්යේෂණ ගැටළුව වේ. එහි පුරාවිද්‍යාත්මක නටඹුන් මගින් හෙළිවන ඓතිහාසිකත්වය විමර්ශනය කිරීම හා මෙම භූමිය සංරක්ෂණය සඳහා පෙළඹවීම යන අරමුණු යටතේ මෙම අධ්‍යයනය සිදු කරන ලදි. ක්ෂේත්‍ර අධ්‍යයනයෙහි නිරත වෙමින් කලින් කලට එම විහාරයේ වැඩසිටි හිමිවරුන් සහ වත්මන් භාරකාරීත්වය සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගින් දත්ත ඒකරාශී කරන ලදි. බෞද්ධ ජනයාගෙන් තොර ප්‍රදේශයක් වීම, නටඹුන් පැහැර ගැනීම, ආරාම සංකීර්ණය අතුරු මාර්ගයක් ලෙස භාවිත කිරීම, නිධන් සාරන්නන්ගේ ක්‍රියාවන් වැනි සාධක හේතුවෙන් නටඹුන් රාශියක් විනාශ වී තිබේ. කිසිදු සංරක්ෂණ කටයුත්තක් මෙම ස්ථානයේ ක්‍රියාත්මක නොවීම ස්වාභාවික ලෙස නටඹුන් විනාශයට බලපා ඇත. සමාධි ප්‍රතිමාවට සමාන ශෛලමය ප්‍රතිමාවක් මෙහි 80 දශකයේ දී තිබී ඇත. නූතන භාරකාරත්වය සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවලින් තහවුරු වූයේ එම ප්‍රතිමාව ත්‍රස්තවාදී කලබල සමයේ අතුරුදහන් වී ඇති බවයි. තව ද මෙහි පවතින ආසනසරයට සමාන ආසනසරයක් පැවති බවත් එය ගම්මානයට ආසන්න කෝවිලකට රැගෙන ගොස් එහි පූජා කටයුතු සඳහා භාවිත කරන බවත් ප්‍රකාශ කරන ලදි. මෙහි පවත්නා නටඹුන් මගින් අනුරපුර යුගයේ මුල් භාගයේ ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂතා හඳුනාගත හැකි බැවින් ක්‍රිස්තු පූර්ව යුගයේ ජන සමාජයේ සාක්ෂරතාව හා චින්තනාත්මක දියුණුව මෙම පුරාවිද්‍යා නටඹුන් තුළින් හෙළි වේ.

ප්‍රමුඛ පද : නටඹුන්, පුළුකුණාව, ලෙන්, විහාරාංග, ශෛලමය

---

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.wrthero.wr1996@gmail.com